පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය

සතිය- 7

ශ්‍රේණිය-12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

විද්‍යාත්මක සාමාන්‍යකරණය

1. විද්‍යාත්මක උපන්‍යාසයක ලක්ෂණ පැහැදිලි කරන්න.
2. උපන්‍යාස ගොඩනැගීම සඳහා ආකෘතීන් හි වැදගත්කම උදාහරණ මගින් පැහැදිලි කරන්න.
3. විද්‍යාත්මක ව්‍යාඛ්‍යානය යනු කුමක්ද?
4. පහත ප්‍රකාශ කුමන ව්‍යාඛ්‍යාන ප්‍රභේදයකට අයත් දැයි ඉදිරියෙන් ඇති හිස්තැනෙහි ලියා දක්වන්න.

1.) ඇය බලා සිටින්නේ ඇයි?ඔහු එනතුරුය. (.....)
2.) අපට දිවා රෑ ඇති වන්නේ ඇයි?පෘථිවිය ස්වකීය අක්ෂය වටා භ්‍රමණය වීම නිසාය. (.....)
3.) ආමාශය ඇත්තේ ආහාර දිරවීමටය. (.....)
4.) ඔරලෝසු බට්ටාගේ දෝලන කාලාවර්තය නියතව පවතින්නේ ඇයි? (.....)